වනාන්තරයේ අතරමංව සිටියදී නිවුන් අලි පැටවුන් හමුවීමෙන් පුදුමයට පත්වූ නීනා සහ කීනු ඔවුනට සිතාගත නොහැකි තරම් ත්‍රාසජනක මට්ටමේ ගමනක් ආරම්භ කරයි.

අලි ඇතුන් සහ ළමා භූමි කතාව යනු එක්සත් ජාතීන්ගේ තිරසාර ඉලක්ක වෙත ළමුන් හදුන්වා දෙන කතා ත්‍රිත්වයක පළමු වැන්නයි.

අලි ඇතුන් සමගින් ලියන මේ කතාව සොබාදහම සමග එකතු වී කටයුතු කිරීමෙන් අපට වඩාත් සුන්දර ලෝකයක් ළගා කරගත හැකි බව අපට සිහි ගන්වයි.

එකිනෙකට සම්බන්ද වූ කලා කෘති තුනක එකතුවකි. තිරසාර සංවර්ධන ඉලක්ක වෙත ළමුන් හදුන්වා දීම.

# අලි ඇතුන් සහ ළමා භූමි කථාව



රූප සටහන් අයිද්‍රිස් වැන් හෙෆන් විසිනි

# අලි ඇතුන් සහ ළමා භූමි කථාව

රූප සටහන් අයිද්‍රිස් වැන් හෙෆන් විසිනි

කතෘවරු :
පැට්‍රිෂියා බ්‍රවුන්,
ඇනට් හැඩවේ,
ලොව පුරා රැඳවුම් භාරයේ වෙසෙන වන අලි ඇතුන්.

සංස්කරණය: සැන්ඩි මිලර්

රූප සටහන් අයිද්‍රිස් වැන් හෙෆන් විසිනි.

ග්‍රැෆික් නිර්මාණ: ක්‍රිස්ටිනා කිමොනි, කිමොනා නිර්මාණ

දායකත්වය :
ඉවොන් බෙරී,
ටීනා සීබර්,
ටෙරා නොරිහිරො
මාතා මා,
සූ බ්ලෙයිත්,
ඉන්ග්‍රිඩ් ලාසන්,
වෛද්‍ය ලිසින්කා උලතොව්ස්කා විසින් මෙහෙයවනු ලබන එක්සත් ජාතින්ගේ රාජ්‍ය නොවන සංවිධානයේ ප්‍රධාන පොදු කණ්ඩායම, වෛද්‍ය මයියා කිංකේඩ් විසින් මෙහෙයවනු ලබන ගෝලීය පරිවර්තනය සඳහා වූ ස්වභාවික සන්නිවේදන පංතිය. All-win ජාලය

කණ්ඩායම් නායක : ඇනට් හැඩවේ, සත්ව හා සොබාදහම සම්භන්දීකාරක.

මිහිකත සියලු වැසියන්
වෙත ආදරයෙන් හා
සමගියෙන් ප්‍රදානය කරන ලදී

" කතාව කියන්න මට ඉඩ ලබා දෙන්න " අලියා පැවසීය.
“පෘථිවි තලයේ වණජීවී මංකඩවල් සියල්ලම ඇති කාලයක ගොඩබිම සාගරය සහ වාතය සියල්ල මැකී ගොස් ඇත.”





අලියා  කතාන්දරය මෙලෙස ආරම්භ කරන ලදි.

"අපොයි ! කීනු නම් පිරිමි ළමයෙකු ගැටගැසීමට අමතක වූ තම සපත්තුවේ ලේස් මත පැටලී අසල වූ ඇළකට වැටුනු අතර, තම සහෝදරිය වන නීනාද එම ඇළට බැස්සේ ය. "

"අපේ දෙමාපියනුත් නැති වෙලාවේ, අද අපිට සෙල්ලම් කරන්න ලැබීම අපේ වාසනාවක්, එහෙම නේද නීනා"

" ඔව් කීනූ, මේක නීරස  සැපයුම් සංවිධානය කර කර කදවුරට වෙලා ඉන්නවට වඩා විනෝදාත්මකයි," තම අත කීනු වෙත දිගුකර වතුරින් එලියට ඒමට උදව් කරමින් නීනා පැවසීය. "එන්නකෝ මේ දේදුනු පාට මාළුවා බලන්න."

" මට මෙතනට එය ලස්සන පේනවා නීනා. ඔයාට පිටුපසින් ලොකු පදුරක් තියෙනවා, පේන විදිහට නම් එකේ අඹත් තියෙනවා වගෙ. දැන් නම් බඩ ගින්නකුත් එනවා . යමු යමු ගිහිල්ලම බලමු." කීනූ පැවසීය.

" අනිවාර්යයෙන්, මටත් බඩගිනියි. දෙන්නම එහාට දුවමු" නීනු පැවසීය.



කීනු අඹ ගෙඩියක් කැඩීමට අත දිගු කරනවාත් සමගම එම අඹ ගෙඩියම අල්ලා ගත් අලියෙකුගේ හොඬවැලක් දිස්වන්නට විය. කීනු බියට පත්ව පිටුපසට පනිනවාත් සමගම නීනා දුවගෙන විත් අලියාගේ හොඬවැලෙන් අඹ ගෙඩිය උදුරා ගන්නට විය.

" ඒක ආපහු දෙන්න ! " අලියා පවසන්නට විය

" අපි හැමෝටම ඇති වෙන්න බෙදාගන්න අඹ තියනවා "හරියටම පළමු අලියාට සමාන පෙනුමකින් යුත් දෙවන අලියා පැවසීය.

" ඇත්තටම ඔයා හරි,අපිට බෙදාගන්න පුළුවන් "අඹ පදුර වටේ එබී බලමින් සිටි තරුණ අලි දෙදෙනා දුටු කීනුද ඊට එකඟ විය.





" මං දැනන් හිටියෙ නැනේ අලි ඇතුන්ට කතා කරන්න පුලුවන් කියලා " නීනා පැවසීය.

අලින්ද උත්තර දෙන්නට විය, " අපිත් දැනගෙන හිටියෙ නැනේ මිනිසුන් හට අපිව ඇහෙනවා කියලා" රසවත් පළතුරුවලින් කුස පුරවා ගන්නා අතරම ඔවුන් සිව්දෙනාම එක් ප්‍රධාන තැනකට ලගා විය.

" මේ ඉන්නෙ මගෙ සහෝදරයා කීනු, මම නීනු. එතකොට ඔයාලගෙ නම් මොනවද? "

" අපි දේදුනු රංචුවේ නිවුන්නු උඩු සහ දග්ඩා. මේ වනාන්තරය තමයි අපෙ ගෙදර. ඔයාලගෙ ගෙදර කොහෙද ?" උඩු විමසීය.

" අපි පර්යේෂණ කදවුරේ අපේ දෙමාපියන් සමග නැවතිලා ඉන්නේ ඒත් ආපහු එතනට යන්නේ කොහොමද කියලා දන්නේ නැහැ." කීනු පැවසීය.

" ආපහු යන්න අපි ඔයාලට උදව් කරන්නම්. අපි ඔයාලගේ ගමන්මළු වලට ආහාර එකතු කරගමු." ඒ වනවිටත් ඔවුන් වනාන්තරයේ ඇතුලටම ගොස් සිටි බැවින් දග්ඩා එසේ පැවසීය.

අලි ඇතුන් වඩා ආරක්ෂිතව හොඩවැල කරකවමින් ඉදිරියට දිව ගියහ. නීනා සහ කීනු ද සෙල්ලම් කරමින් සිනාසෙමින් අලින්ට වඩා ඉදිරියෙන් දිව ගිය අතර ඔවුන්ගේ කට බෙරි වලින් පුරවා ගැනීමට පමනක් නතර වන්නට විය.නිවුන් අලි පැටවුන් මෘදු ආලෝකයෙන් දිස්වන ඇඹරැල්ලා ගසක් වෙත දිව ගොස් බැටලුවකු මෙන් එහි ගැටී ගස සොලවා, නීනා සහ කීනු හට තම ගමන් මලු පුරවා ගැනීමට හැකි වන පරිදි ගෙඩි බිම හෙලන්නට විය.

" මම මීට කලින් කවදාවත් මේ වගේ රස පළතුරු කාලා නැහැ.
" තම නිකට දිගේ බේරෙන පැණි පිස දමමින් නීනා පවසන්නට විය.

" ඔව්, මෙම පළතුරු හරිම රසවත්. අපි මේවා ඖෂධ වශයෙනුත් භාවිතා කරනවා" උඩු පැවසීය.

" මේවා ඖෂධ විදියට භාවිතා කරන්නෙ කොහොමද?" කීනු  විමසීය.

" මේවා කැක්කුම, කැපුම් තුවාල සුව කිරීමෙ ඖෂධයක්, අපෙ ඇස් පෙනීමට උදව් කරන විටමින් වගෙ හුගක් දේවල් " දග්ඩා පැවසීය. සිව්දෙනාම වනාන්තරයේ ඇතුලටම ගමන් කිරීමත් සමග එහි වූ සියලු වර්ණ ඉතා සිත් ඇදගන්නා සුළු විය. මෙම මණස්කාන්ත භූ දර්ශණ වනාන්තරයේ සෑම මතුපිටකම නිදන් සොයා ගැනීමට පූර්ව නිමිත්තක් විය.





"ගයා නැන්දේ , අඳුන ගන්න අපේ අලුත් යාළුවෝ" දග්ඩා සහ උඩු එක හඬින් පැවසීය.

" ආ මේ ඉන්නෙ ඔයාලා" ගයා නැන්දා පවසන්නට විය.

" මම ඔයාලව හෙව්වා".

" අපි මෙතනම තමයි හිටියෙ " දග්ඩා පැවසී.

නිවුන් අලි පැටවුන් සහ ළමුන් දෙදෙනා ඔවුන් එකිනෙකා මුණ ගැසුණු ආකාරයත්, නීනා සහ කීනුට නැවතත් තම කඳවුරු කරා යාමට මාර්ගය සොයා ගැනීමට නොහැකි වූ බවත් ඔවුන් ගයා නැන්දා සමග පැවසීය. පසුව ගයා නැන්දා තම රංචුව දිය නෑම සඳහා වනාන්තරයේ ඇතුලට යාමට සූදානම් වන බව පැහැදිලි කළාය.

" අපිටත් පීනන්න එන්න පුලුවන් ද?" නීනා උද්‍යෝගයෙන් අසන්නට විය.

" නිසැකවම, ඊට පස්සේ උඩු සහ දග්ඩා ඔයාලව ඔයාලගෙ දෙමාපියන්ගෙ කඳවුරට ගිහින් ඇරලවයි" ගයා නැන්දා පැවසීය.



උඩු සහ දග්ඩා පිහිනුම් ස්තානයට යාමට මග පෙන්වූ අතර නීනා සහ කීනු ඔවුන් පසුපස ගමන් කලේය. ගයා නැන්දා සියල්ලටම පිටුපසින් ගමන් කලාය. ඇවිද යන සියලු දෙනාගෙම පා සටහන් කොල මත හැපෙන්නට විය.

කහ සහ දම් පැහැති පුංචි කුරුල්ලෙකු කිචි බිචි ගාන්නට විය, "ඒයි, ඔබට පුලුවන් ද ඔබ ඔය පා තැබූ අතු අතු කැබැල්ල උඩට විසි කරන්න? මගෙ කැදැල්ල හදා ගන්න ඒක ලොකු සහනයක් වෙයි. "ගයා නැන්දා නතර වී තම හොඩවැල ආධාරයෙන් හැම  පුංචි අතු කැබැල්ලකම කුරුල්ලා වෙත පරිස්සමින් ළගා කරන්නට විය. කුහුඹුවන් කණ්ඩායමක් කැදැල්ල සැකසීම සදහා කොළ රැගෙන යාමට මාර්ගක් ලෙස ගස දිගේ රැදී සිටියහ. වනාන්තරය ගී ගයන්නට විය. මිනිසුන් සිනාසෙන්නට විය. අලි ඇතුන්  කුංචනාද කරන්නට විය. ආදරය, සැනසීම සහ ප්‍රීතිය සමූහයක් ලෙස කණ්ඩායම වට එක් රොක් වූහ.



එල්ලෙන කුඩු බහුල ඉඳි ගස් මග දෙපස විය. ඉඳි ගස් වල පාට සහ ප්‍රමාණය ආකර්ෂණීය වූ අතර ඒ දෙස  බලමින්, " අපි කොහොමද මේවා කඩා ගන්නේ? "යැයි නීනා අසන්නට විය. ගයා නැන්දා පිළිතුරු දීමට සැරසෙන විටම බුල්ඩෝසරයක ශබ්දයකින් ඊට බාධා එල්ල විය.

" මේ අසල බුල්ඩෝසර තියෙනවා" උඩු පැවසීය.

" අපි ගයා නැන්දා ලගට ලං වෙමු" දග්ඩා පැවසීය.

නීනා සහ කීනු එකිනෙකා දෙස බලන්නට විය. පසුව නීනා මෙසේ පැවසීය, " අපිට මොකුත් ඇහෙන්නේ නෑනේ ".

" අපි දන්නවා ඔයාලට ඇහෙන්නේ නෑ කියලා" තම හොඬවැලෙන් දරුවන් තමා ළගට කර ගනිමින් ගයා නැන්දා පැවසීය. " අලි ඇතුන් වන අපට කිලෝමීටර තුනකට එහා දුර ශබ්දයන් පවා ඇසෙනවා. අපේ පාද වලින්ද අපට ශබ්දයන් අදුනා ගත හැකියි."

" ඔයා අපිව ආරක්ෂා කරනවද ගයා නැන්දේ" කීනු විමසීය.

" ඔව්, ගස් ඔවුන්ගේ වර්ණවලින් මාව ආවරණය කරයි" ගයා නැන්දා කීවාය.

" මම කල්පනා කළේ ඇයි අපි හැමෝම රත්තරං වගෙ කියලා "කීනු පැවසුවේය

" වනාන්තරය අපිට අවශ්‍ය හැමදේම සපයනවා. ඒක නිසාම තමයි බුල්ඩෝසර් භයානක: එයාල අපේ සමූහය සහ නිවහන් විනාශ කරනවා. දැන් අපි මෙතනින් ඉවත් වෙමු " පිහිනුම් ඇල්ල කරා සියලුදෙනාටම මග පෙන්වමින් ඇය පැවසීය.

එහි ගිය පසු ඔවුනට දක්නට ලැබුණේ අටදෙනෙකුගෙන් සමන්විත දිය සෙල්ලම් කරමින් සිටි අලි රංචුවකි. ඔවුන්ගෙන් සමහරෙක් මල්ලවපොර ද තවත් අය වතුර බොමින් ද තවත් සමහරෙක් තම පා දියේ දමමින්ද සිටියහ.

" ෂා! ඒ හැම කුංචනාදයකටම සවන් දෙන්න." නීනා පැවසීය.

" එයාලා අපව පිලිගන්නවා " නිවුන් අලි පැටවුන් ඇළට පනින ගමන් එක හඬින් පැවසීය.




කීනුට දිය ඇල්ල අසල දේදුන්නක් දිස් වූ පර්වතයක් හමු වූ අතර ඒ මත වැතිරී නොඉවසිල්ලෙන් දේදුන්න දෙස බලා සිට ගයා නැන්දා දෙසට හැරීය. " මම මෑතක ඉදන් ගොඩාක් දේදුනු වර්ණයන් දැක්කා," ඔහු ඇයට පැවසීය. "දේදුනු යන්නෙහි විශේෂ තේරුමක් තියනවද? "

" ඔව් තියෙනවා," ගයා නැන්දා පිළිතුරු දී එය පහදන්නට විය. මීට සියවස් ගණනාවකට පෙර අලෝකයක් පැතිර ගියේය. එවිට බයෝබැබ් වනාන්තරය මත වර්ෂාව පතිත වන්නට විය. එම ජල බිංදු ඒ ගස්වල කොළවලින් සෑම මලක් මතටම පෙරලී ගියේය. දේදුන්නක් මුලු අහසම ආවරණය කල අතර ඉන් පසුව එහි අලි රංචුවක් පැමිනෙන්නට විය. එතැනින් පසු ඔවුන් විසින් තමන් දේදුනු රංචුව ලෙස හදුනා ගන්නට විය.

" එය හරි අපූරු කතාවක් නේ, බොහොම ස්තුතියි අපට එය කියා දුන්නාට" කීනු පැවසීය.

" දැන් ඔයාල ඔයාලගෙ දෙමාපියන් ළගට ආපසු යන්න වෙලාව හරි " ගයා නැන්දා පවසන්නට විය.



"මම මගේ දෙමාපියන් දැකීමට හරිම උද්‍යෝගයෙන් ඉන්නේ " නීනා උඩුට පැවසීය.පසුව ඇය මඳක් නවතී " ඔයාලගෙ දෙමාපියන් පිහිනුම් ඇල්ලේ සිටියෙ නැහැනෙ, එයාල කොහෙද ? " යැයි ඇසීය.

" අපේ තාත්තා කන්න අලුත් තැන් හොයන ගමන්ම අලුතෙන් කැලෑ ස්ථානත් හදනවා . අපේ අම්මා බුල්ඩෝසරයකින් අරන් ගිහින් රඳවා ගෙන වැඩ කරවගන්නවා." උඩු පැවසීය.

" ඒක හරිම භයානකයි. මට නම් මගෙ අම්මා මගෙන් උදුරගන්නවා කියන එක හිතා ගන්නවත් බෑ " නීනා පැවසීය.

එවිට දග්ඩා " අපිට හරියට ඇයව මතක් වෙනවා ඒ වගෙම අපි ගයා නැන්දට ස්තුතිවන්ත වෙනවා අපිව බලාගන්නවට" යැයි පැවසීය.

" ඔයාගෙ තාත්තා තනිවම ද අලුතින් තැන් හදන්නෙ?" නීනා ඇසීය.

" මගේ තාත්තා වගෙ ලොකු අලි ඇතුන් එකට වැඩ කිරීම ප්‍රවර්ධනය කරන ගමන්ම එයාල ගොම හරහා ආහාර බීජ සිටුවනවා. සොබාදහම සමග සිටීමෙන් ඔවුන් නව ජීවිතයක් නිර්මාණය කරනවා ! දග්ඩා පවසන්නට විය.

" අපි යන්න කලින් අපේ දෙමාපියන්ටත් ඇවිත් ඔයාලව බලන්න කිව්වට කමක් නැද්ද ?" නීනා ඇසීය.උඩු සහ දග්ඩා තම යහලුවන් නැවත දැකීමේ සිතුවිල්ලෙන් සතුටින් කුංච නාද කරන්නට විය. නීනා සහ කීනු ඔවුන්ගෙ කදුවුරු මායිමට ගෙනත් ඇරලු පසු ඔවුන් පරිසමෙන් කදවුර වෙත ගමන් කරන අයුරු බලා සිටීමෙන් අනතුරුව අලි ඇතුන් නැවත වනාන්තරය වෙත පිය නගන්නට විය. උඩු සහ දග්ඩා නැවත ඔවුන්ගෙ රංචුව වෙත යාමෙදී බුල්ඩොසරය දැකීමෙන් පුදුමයට පත් විය.





එසැනින් ඔවුන් ලණුවලින් ගැට ගසන බවක්  දැණුනු අතර " අල්ල ගත්තා." යැයි පිරිමි කට හඬකින් පවසනු ඔවුන්ට ඇසුනි.

ඊළඟට ඔවුන් ට්‍රක් රථයක පිටු පසට ඇදී යන බව ඔවුන්ට වැටහිනී. කඳවුර තුලට ඇවිද යන නීනා සහ කීනුටද බුල්ඩෝසරයේ ශබ්දය ඇසුනි. නීනා සහ කීනු දුවගෙනවිත් ට්‍රක් රථයේ පිටුපස සිටින ඔවුන්ගෙ අලි මිතුරන් සෙවීය. මිනිසුන් කිහිපදෙනකු උද්‍යෝගයෙන් අලි නිවුන් පැටවුන් ගෙන ඒමට ඉතා අධික මිල ගනන් පිළිබඳ කතා බහක නියලෙන අකාරය ඔවුන්ට ඇසුනී. නීනා සහ කීනු ට්‍රක් රථයට නැග එහි සැගවිය. තව දුරටත් කතාවෙහි  නිරත ඔවුන් නිවුන් අලි පැටවුන් සත්වෝද්‍යානයක, සර්කස් හෝ ධනවත් මිනිසුන් හට සුරතල් සතුන් සඳහා විකිණීමට සැලසුම් කලේය. නීනා සහ කීනු එහි වූ බවට ඔවුනට වැටහීමක් නොවීය.

ඉතා අසීරු දිගු ගමනකින් අනතුරුව ට්‍රක් රථය නවත්වන්නට විය.
"මට හිතා ගන්න බෑ අපි කොහෙද ඉන්නෙ කියලා " කීනු මුමුණන්නට විය.

එවිට උඩු පැවසුයේ" අපිව රැගෙන විත් තියෙන්නෙ කැලේ අද්දර
ඇති කදවුරට" බවයි.

" කීනු ඉක්මන් කරන්න, අර මිනිසුන් අපිව දකින්න කලින් අපි ට්‍රක්රථයෙන්
ඉවත් වෙන්න ඕනේ. " නීනා ඉල්ලා සිටියාය.

" නිශ්ශබ්දව සිටීමට වග බලා ගන්න, අපි කැමති නෑ එයලා ඔයාලව අල්ලා
ගන්නවට" දග්ඩා ඉල්ලීය.

නීනා සහ කීනු නිහඬවම ට්‍රක් රථයෙන් බැස විශාල අඹ ගසක් පිටුපස
ආරක්ෂිතව සැගවිය. අලි ඇතුන් බලහත්කාරයෙන්ම ට්‍රක්රථයෙන් ඉවත් කර
තාවකාලිකව අටවන ලද ගොඩනැගිල්ලක් අසල විශාල වැටක් සහිත
ප්‍රදේශයකට රැගෙන යන ආකාරය බලා සිටියහ. උඩු සහ දග්ඩා කුංචනාද
කරමින් ඔවුනට ළමුන් සොයා ගැනීමට නොහැකි වන ලෙස බාධා කරන්නට විය.
ඒ ගැන කේන්තියට පත් එක් පුද්ගලයෙකු විශාල පොල්ලකින් පහර දෙන්නට විය.
කෝපයට පත් නීනා පඳුරෙන් එළියට විත් දත්මිටි කමින් තම අත දිගු කර ' ඕක
නවත්වන්න' යැයි කෑගහන්නට විය. ඇය නැවැත්වීමට කීනු උත්සහ කලද ඔහුට
ඇය මග හැරුණි. ඔහුද පඳුරෙන් එළියට විත් නීනා පසු පස යන්නට විය. එවිට
'අල්ලාගත්තා' යනුවෙන් හඬක් ඔහුට ඇසුනි.





කීනු සහ නීනා ඔවුන් කලින් දුටු ගොඩනැගිල්ලේ සිර කර ඇති බව වැටහිනී. " මෙතන හරිම කළුවරයි, ඉන්න මං මගේ  බෑගයෙන් විදුලි පන්දම එලියට අරගන්න," කීනු පැවසීය.

එම පන්දම සොයා ගත් පසු කීනු එය කාමරය පුරා දල්වමින් සතුන් විශේෂ ගණනාවක්ම එහි ඇතිබව හෙලි කර ගත්තේය. එකපාරටම කාමරයේදි පණ ගැහෙන්න ගත්තේ සතුන්ගේ කතා බහෙනි. නීනු හඬ අවදි කලේය,
" එකපාරකට එක්කෙනෙක් කතා කරන්න, ඔයාල ඔක්කොම එකවර කතා කරකොට මට ඔයාලව  පැහැදිලිව ඇහෙන්නේ නැහැ ."

"එකපාරකට එක්කෙනෙක් කතා කරන්න, ඔයාල ඔක්කොම එකවර කතා කරකොට මට ඔයලාව පැහැදිලිව ඇහෙන්නේ නැහැ ." අළු ගිරවෙක් ඇයව අනුකරණය කලේය. බකමූණු මුහුණින් යුත් වඳුරන් සිනාසෙමින් කෑ ගැසුහ. කබල්ලෑවන් පන්දම් ආලෝකයෙන් මිදීමට බෝලයක් මෙන් පෙරළී ගියේය. පිඹුරන් ආරක්ෂාව සදහා එකට ඇලී වෙලී සිටී. " හැමෝම සංසුන් වන්න," චීටා පැවසීය  " අපි මේ ළමයින් හදුනා ගමු."



" අපිව අඳුන්වා දෙන්න මට ඉඩ දෙන්න. මම කීනු, මේ මගෙ සහෝදරිය නීනා. අපි අපේ අලි යහලුවන් බේරා ගැනීමට යාමේදි අහු උනා. ඔයාල මෙහෙ ගොඩක් කල් ඉදන් ඉන්නවද?"

" දවස් දෙකකට කලින් අපිව කැලේදි අල්ලගත්තා. මිනිස්සු අපිව විකුණන්නයි හදන්නේ " චීටා පැහැදිලි කලේය.

හදිසියේම ඔවුනට අඩි සද්දයක් ඇසෙන්නට විය. කීනු පන්දම නිවා දැමීය. දොර විවර වූ පසු දිස් වූයේ දීප්තිමත් රූපයක් ය ඒ සමගම ඇතුලු වූ වාතයෙන් කාමරය පිරී ගියේය.

" භය වෙන්න එපා, මං ඔයාලට බොන්න වතුර අරන් ආවා. ඔයාලට දැන් තිබහත් ඇති නේ," යනුවෙන් කටහඬක් ඇසෙන්නට විය. කීනු සිය පන්දම නැවත දැල් වූයේ ඉරුණු ඇඳුම් වලින් සැරසී සිටින කුඩා දුර්වල පිරිමි ළමයා දැකීමටය. " මගෙ නම ඉඩින්. ඔයාලව මෙතනට අරං ආපු මිනිසුන් එක්කෙනකුගෙ පුතෙක්."

" ඔබලා අපිව කොහෙද රැගෙන යන්නෙ?" කීනු ඇසීය.

" මගෙ තාත්තායි ඔහුගෙ පිරිසයි සැලසුම් කරන්නේ ඔයාලව වෙනත් රටකට යවල මේ අනෙක් සතුන් සමගම විකුණන්නයි " ඉඩින් පැවසීය.

" විකුණන්න ? ඔයාලට අපිව විකුණන්න බෑ . අපේ දෙමාපියන් ඒකට ඔයාලට ඉඩ දෙන්නෙ නෑ . මට විශ්වාසයි එයාල දැනටමත් අපිව හොයනවා ඇති" කීනු පැවසීය.

" මගෙ තාත්තා සහ පිරිස හෙට සැපයුම්කරුවන් හොයන්න නගරයට යනවා. ඒ වෙලාව තමයි ඔයාලට මෙහෙන් පැන ගන්න පුළුවං හොදම වෙලාව " ඉඩින් පවසන්නට විය.





පෙර ඇඟවීමකින් තොරව එකවරම ඉඩින්ගේ ඇඟ ගැහෙන්න්ට පටන් පටන් ගත්තෙ දරුණු කැස්සක් ද සමගයි. ඔහු තම කමිසයේ කොටසක් ඉරා කට වට පිස දැමූ අතර නොනවත්වාම පැවති කැස්ස හේතුවෙන් කමිසයේ ලෙයින් තෙත් විය.

" ඔබ අසනීපයෙන් ද?" නීනා ඇසීය.

එවිට ඉඩින් " මෙහෙම වෙන්නෙ පෙනහලු රෝගයක් නිසා. අපේ ප්‍රජාවට සරිලන ආහාරපාන සහ වෛද්‍ය පහසුකම් සදහා අවශ්‍ය මිලමුදල් නොමැතිකම නිසා මං ලෙඩ වෙලා ඉන්නේ. අපිව උණුසුම්ව තබා ගැනීමට සහ ආහාර පිසීම සදහා අපේ ගෙවල්වල ගින්දර තියෙනවා. ඒවගෙන් නැගෙන දුම හුස්ම ගැනීම කරවන්වා. මගෙ රෝගි තත්වය නිසා මට කරන්න පුලුවන් එකම දේ සතුන් බලා ගැනීම පමණයි. මගෙ තාත්තා සත්තු විකුණන්නේ වෛද්‍යවරුන් හමුවෙන්න අවශ්‍ය සල්ලි හොයා ගන්නයි."

එවිට කීනු " මට ඔයාට උදව් කරන්න ඉඩ දෙන්න, වාඩිවෙන්නකෝ"

" කීනු මතකද ඔයාට අර රසවත් පළතුරු ගැන අලි ඇතුන් කියපු කතාව?" නීනා ඇසීය.

" ඔව් මට මතකයි" කීනු පැවසීය. " එයට සුව කිරීමේ බලයක් තියෙනවා ".

එකවරම උඩු සහ දග්ඩා තම හොඬවැල ලෝහ තහඩු හිඩැස් තුලින් එළියට දමා " අපිට ඔයාලගේ සංවාදය ඇහුනා" උඩු පැවසීය.

" නීනා ඔයාගෙ ගමන් මල්ලේ ඒ රසවත් පළතුරු තියෙනවා. එවගෙන් ටිකක් ඉඩින්ට දෙන්න ඔහුව සුව කරන්න" දග්ඩා පැවසීය.

" ඒක ඇත්ත " නීනා පලතුරු බෑගයට අත තබා ඒවා ඉඩින් අතට දෙමින් කෑගැසුවාය.

" ඔක්කොම මටද?"ඉඩින් පුදුමයෙන් අසන්නට විය.

" ඔව්" උඩු පැවසීය, " එසේම ඔබට ඉක්මනින් සුවයක් දැනෙන්නට පටන් ගනීවි.

කීනු සහ නීනා ඔවුනටද ටිකක් ළග තබා ගනිමින් ඉතිරි පළතුරු සියල්ලම සියලුම සතුන් වෙත බෙදන්නට විය. පසුව ඔවුන් රෑය පහන් කිරීමට සුදුසු ලෙස සැරසී ඉඩින් ගේ නිවස අසල රෑය පහන් කලහ.



" පසුදා උදෑසන ම ඉඩින් කීනු සහ නීනා හට පැවසුවේ තමන්ට දැන් සුවයක් දැනෙන බවයි. එලෙසම ඔහු සහ ඔහුගෙ පියාට එම පළතුරු තියෙන ස්ථානයට මග පෙන්විමට හැකි දැයි ඔවුන්ගෙන් විමසුවේ ය. " මෙම පළතුරු අපෙ මිනිසුන් බොහෝ දෙනෙක් ගෙ ජීවිත ආරක්ෂා කිරීමට උපකාරි වෙයි" ඉඩින් පැවසීය.

" ඔව්, ඔබ නිවැරැදියි" ගයා නැන්දා ගේ කටහඬ මතු විය.

" ගයා නැන්දේ ඔයා කොහෙද ?" නීනා කෑගැසුවාය.

" මං මෙතන" ඇය පිළිතුරු දුන්නේ වහලය මත වූ පැනලය ඉවතලමින් ය.
" මං ඔයාලා දිහා බලාගෙනයි හිටියෙ. ඔයාල කොහේදැයි මම දැන ගෙන හිටියෙ. මට ඇහුනා මිනිසුන් දවස් තුනකට මෙහෙන් ඈතට යන්න හදන්නේ කියලා . අපි ඔබලා මෙතනින් එලියට ගන්නම්. එය අපට ඔයාලගෙ මුළු ගමටම පළතුරු සොයා දීමට ." කාලය ලබා දේවි

චීටා තම උගුර පාදමින් අනතුරුව " සමාවෙන්න බාධා කරනවට, ඒත් ඔයාලට පුලුවන් ද අපව නිදහස් කරන්න?"

" නිශ්චිතවම " ඇය ඇගේ හොඩවැල පහළට දමමින් කූඩුවල අගුළු හරිමින් ගයා ගයා නැන්දා පැවසීය, එ අතර නිනා, කීනු සහ ඉඩින් ඔවුන් සියල්ලම නිදහස් කීරිමට දොර විවෘත කලේය.





ගයා නැන්දා, උඩු, දග්ඩා , කීනු , නිනා සහ ඉඩින් කැලයට යන අතර වාරයේ ගයා නැන්දා කණ්ඩායමට වැල් එකතු කිරීමට යෝජනා කලේ ඔවුන් ගමට ගෙනයන ආහාර ගබඩා කරන කූඩ සෑදීමටය. හැමෝම රැගෙන යාමට කූඩ ආහාර වලින් පුරවා ගත්තේය. ඔවුන් නැවත ගමට යන විට ඉඩින්ගේ පියා සහ පිරිස මුණගැසුණේ සැපයුම් සංචාරය නිමා කරමින් පැමිණෙන විටය

" තාත්තේ," ඉඩින් සතුටින් කෑගැසුවේය, " අප  සුවදායි ආහාර ගෙනාවා".

අලි ඇතුන් අපගේ මිනිසුන්ට ආරධනා කර සිටිනවා වනාන්තරය අපව පෝෂණය කර සුව කරන්නේ කෙසේ දැයි ඔවුනගේ දැනුම බෙදා හදා ගන්නා ලෙස. ඔහුගේ අත දිගු කරමින් ඉඩින් පැවසුවේ " මම මේ රසවත් පළතුරු කෑවා, එය දැනටමත් මාව සුව කරනවා".

සියලුම ගම් වැසියන් අලි ඇතුන් සහ ළමයි පිළිබඳ කුතුහලයෙන් ඔවුනට සවන් දීමට ඔවුන් වටා එක් විය.ඉඩින්ගේ පියාණන් තම පුතාව වැළඳ ගෙන ගම්මුන්ට මෙසේ පැවසීය " ස්වභාවධර්මය  සමග එකතුව වැඩ කිරීමට මෙය අපිට හොද පාඩමක්".



"ඒක පාඩමක්,"

ජ්‍යේෂ්ඨ අලු අලියා පැවසීය,

"කවදාවත් අමතක කරන්න එපා."

නීනා සහ කීනු නැවත කඳවුර වෙත යාමේදි එහි කිසිවෙකුත් සොයා ගැනීමට නොහැකි විය. මිනිසුන් සියල්ල ඇසුරුම් කොට පිටත්ව ඇත. ළමුන් සහ දෙමාපියන් එකඟ වී තිබුනේ ඔවුන් එකිනෙකාගෙන් වෙන්වුවහොත් නැවතත් මුණගැසෙන බවටය. උඩු සහ දග්ඩා නීනා සහ කීනු සමග වරායට ගිය අතර එහිදී ඔවුන් තම දෙමාපියන් සෙවීම සදහා නැව් සංචිතයේ පළමු නැවට නැග්ගේය.

එහෙනම් දැන් කතාව අවසන් කිරීමට සහ ඔබට විවේක ගැනීමට  කාලයයි. ඉදිරියේදී " අලි ඇතුන් සහ ළමා මුහුදු කතාවේ " වික්‍රමාන්විතයෙන් හමු වෙන්නම්"

# භූමි කතාව (ප්‍රධාන චරිත)



චරිතයේ නම: කීනු
තේරුම: වාතය
සම්භවය: හවායි



චරිතයේ නම: නීනා
තේරුම: ගින්න
සම්භවය: ස්වදේශික ඇමරිකානු



චරිතයේ නම: ඉඩින්
තේරුම: එකමුතුකම
සම්භවය: ඉග්බෝ/ කොන්ගෝ

චරිතයේ නම: උඩු
තේරුම: ජලය
සම්භවය: හින්දි





චරිතයේ නම: දග්ඩා
තේරුම: පෘථිවිය
මූලාරම්භය: අයර්ලන්ත මිත්‍යා කථාව

චරිතයේ නම: ගයා නැන්දා
තේරුම:  පෘථිවි මව
මූලාරම්භය: ග්‍රීක මිත්‍යා කථා









අපගේ ලෝකය පරිවර්තනය කිරීම සඳහා තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) 17:

කතාව තුළ ඔබට සොයාගත හැකි
තිරසාර සංවර්ධන ඉලක්ක මොනවාද?

ඉලක්කය 1: දිළිඳුකම තුරන් කිරීම
ඉලක්කය 2: කුසගින්න නිවීම
ඉලක්කය 3: යහපත් සෞඛ්‍යය සහ යහපැවැත්ම
ඉලක්කය 4: ගුණාත්මක අධ්‍යාපනය
ඉලක්කය 5: ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය
ඉලක්කය 6: පිරිසිදු ජලය සහ සනීපාරක්ෂාව
ඉලක්කය 7: දැරිය හැකි සහ පිරිසිදු බලශක්තිය
ඉලක්කය 8: යහපත් වැඩ සහ ආර්ථික වර්ධනය
ඉලක්කය 9: කර්මාන්ත, නවෝත්පාදන සහ යටිතල පහසුකම්
ඉලක්කය 10: අඩු කළ අසමානතාවය
ඉලක්කය 11: තිරසාර නගර සහ ප්‍රජාව
ඉලක්කය 12: තිරසාර පරිභෝජනය සහ නිෂ්පාදනය
ඉලක්කය 13: දේශගුණික ක්‍රියාමාර්ග
ඉලක්කය 14: සාගර සහ මුහුදු සම්පත් සුරක්ෂිත බාවය
ඉලක්කය 15: ගොඩබිම තිරසාරත්වය
ඉලක්කය 16: සාමය සහ යුක්ති ගරුක ශක්තිමත් ආයතන
ඉලක්කය 17: ඉලක්කය සපුරා ගැනීම සඳහා හවුල්කාරිත්වය

ස්වභාවධර්මයට අනුකූලව අපගේ ලෝකය පරිවර්තනය කිරීම, එක්සත් ජාතීන්ගේ තිරසාර ඉලක්ක ක්‍රියාවට නැංවීම සඳහා ස්වභාවධර්මය ඒකාබද්ධ කිරීම - ත්‍රිත්ව වැඩිහිටි All-Win Network විසින් සිදු කෙරේ.



නැවත හමුවෙමු. නැවත හමුවෙමු.